# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2011 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 අප්‍රේල් මස 01 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 38.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 20.00 යි.

## 2011 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වන දින]

එල්.ඩී.—ඕ.12/2011.

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2011 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 2007 අංක 10 දරන පනත මගින් සංශෝධිත (මෙහි මින්මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් එකී වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :- 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) (ii) වන අනුඡේදයේ “යම් සේවා නියුක්තයකු විශ්‍රාම ගැනීමේදී, කොමසාරිස් - ජනරාල්වරයා”, යන වචන වෙනුවට “යම් සේවා නියුක්තයකු විශ්‍රාම ගැනීමේදී, එකී විශ්‍රාම ගැනීම 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සිදු වන්නේ නම්, කොමසාරිස් - ජනරාල්වරයා” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) (iii) (ආ) අනුඡේදයේ “නොවන, ඒ පරිපාලිත අර්ථසාධක අරමුදලින් ඒ සේවා නියුක්තයාට” යන වචන වෙනුවට “නොවන ඒ පරිපාලිත අර්ථසාධක අරමුදලින් එම සේවා නියුක්තයා 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සේවයෙන් විශ්‍රාම ගන්නා විටදී ඒ සේවා නියුක්තයාට” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

3. 2009 අංක 19 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි (lx) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීම මගින් :—

"(lxi) 2000 අංක 43 දරන ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලාභ සහ ආදායම්;";

(2) ඒ වගන්තියේ (ඉ) ඡේදයේ "ඒ පුණ්‍යායතනය විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයක ලාභ වන්නාවූ" යන වචන වෙනුවට, "ඒ පුණ්‍යායතනය විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයක 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව උපචිත වන ලාභ වන්නාවූ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (උ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(උ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනතේ අර්ථානුකූලව හෝ ලියාපදිංචිය සඳහා විධිවිධාන සලස්වනු ලබන අදාළ යම් පළාත් සභා ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි කරන ලද යම් සමූපකාර සමිතියක ලාභ සහ ආදායම් සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද ලක් සතොස සමාගමේ ලාභ සහ ආදායම්;";

(4) ඒ වගන්තියේ (එ) ඡේදයේ "අපි වෙනුවෙන් අපි අරමුදලේ ලාභ සහ ආදායම," යන වචන වෙනුවට "අපි වෙනුවෙන් අපි අරමුදලේ ලාභ සහ ආදායම;" යන වචන ආදේශ කිරීමෙන්;

(5) ඒ වගන්තියේ (එ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් :-

"(ඒ) 2011 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භවන්නා වූ වසර දහයක කාල පරිච්ඡේදය තුළ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම-

(i) සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමේ;

(ii) සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගමේ

ලාභ සහ ආදායම්;

(ඔ) 2011 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන්නාවූ අවුරුදු පහක කාල පරිච්ඡේදය තුළ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම-

(i) ලංකා විදුලිබල මණ්ඩලයේ;

(ii) ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ;

(iii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ;

(iv) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ

එකී වර්ෂය සඳහා, අවස්ථාවෝචිත පරිදි, එකී මණ්ඩලයේ, සංස්ථාවේ හෝ අධිකාරියේ දළ ලාභයෙන් සියයට විසිපහක් ආණ්ඩුවට ලාභාංශ වශයෙන් ගෙවනු ලබන්නේ නම්, ලාභ සහ ආදායම."

**4.** 2009 අංක 19 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ජ) ඡේදයේ "කොටසක් පැවරීමකින් හෝ කොටසක් මිළදී ගැනීමේ මනාපයක් ප්‍රදානය කිරීමකින් උපචිත වන යම් ප්‍රතිලාභ" යන වචන වෙනුවට, "කොටසක් පැවරීමකින් හෝ කොටසක් මිළදී ගැනීමේ මනාපයක් ප්‍රදානය කිරීමකින් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව උපචිත වන යම් ප්‍රතිලාභ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (ට) ඡේදයේ "සේවා නියුක්තියෙන් උපයාගත් පඩිනඩි" යන වචන වෙනුවට "සේවා නියුක්තියෙන් උපයාගත් පඩිනඩි;" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ උපවගන්තියේ (ට) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් :-

"(ඩ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් තැනැත්තකුට කුලී රහිතව හෝ කුලී වටිනාකමට

වඩා අඩු කුලියකට සපයා ඇති එක් වාසස්ථානයක කුලී වටිනාකම;

(ණ) සේවායෝජකයා විසින් සපයා දී ඇති එක් මෝටර් වාහනයක් පෞද්ගලික කාර්ය සඳහා පාවිච්චි කිරීමේ ප්‍රතිලාභය හෝ ඒ වෙනුවට ලිත් මාසයක කාලයක් සඳහා ගෙවනු ලබන යම් දීමනාවක් රුපියල් පනස්දාහක උපරිමයකට යටත්ව;

(ත) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන හෝ ශ්‍රී ලංකාවේ වාසික යම් පුද්ගලයකුට 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ දක්වා ඇති ලාභ නොවන සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ රුපියල් ලක්ෂ පහක් ඉක්මවන්නේ නම්, එවිට -

(i) එකී ලාභයේ රුපියල් ලක්ෂ පහ ඉක්මවන එකී කොටස; හෝ

(ii) රුපියල් ලක්ෂයක්,

යන්නෙන් අඩු ගණන;

(ද) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් පුද්ගලයකුට හෝ ධූරයක් දරන්නකුට හදිසි හෝ ප්‍රමුඛතා සේවා සම්බන්ධයෙන් හෝ ඒ පුද්ගලයා විසින් ඉටුකරනු ලබන හෝ සපයනු ලබන යම් විශේෂිත කාර්යයක් වෙනුවෙන් කරනු ලබන කිසියම් විශේෂ ගෙවීමක්;

(න) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන හා වාසික නොවන යම් පුද්ගලයකුට ශ්‍රී ලංකාවේදී කරනු ලබන යම් ජාත්‍යන්තර වැඩසටහනකට සහභාගීවීමෙන් උද්ගතවන නිල පඩිනඩි;

(ප) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන සහ ශ්‍රී ලංකාවේ වාසික නොවන යම් පුද්ගලයකුට ශ්‍රී ලංකාවෙහි උද්ගත වන නිල පඩිනඩි වලින් රුපියල් ලක්ෂ එකක් නොඉක්මවන යම් කොටසක්.”.

5. 2009 අංක 19 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (ඌ) ඡේදයේ "යම් පුද්ගලයකුට එම තක්සේරු වර්ෂයකදී උපචිත වූ හෝ හටගත් පොලියෙන් රුපියල් දෙලක්ෂයකට වැඩි නොවන කොටසක්" යන වචන වෙනුවට,

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

"යම් තැනැත්තකුට -

(i) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන්වන යම් තක්සේරු වර්ෂයකදී උපචිත වන හෝ හටගත් පොලියෙන් රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන; හෝ

(ii) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයකදී උපචිත වන හෝ හටගත් පොලියෙන් රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන,

යම් පොලී කොටසක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**6.** 2009 අංක 19 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදයේ "ඉටුකරන ලද සේවා වෙනුවෙන්; සහ" යන වචන වෙනුවට "ඉටුකරන ලද සේවා වෙනුවෙන්;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "අක්වෙරළ ව්‍යාපාර වෙනුවෙන්; ඉටුකරන ලද සේවාවන් සම්බන්ධයෙන් ඒ සමාගම විසින්" යන වචන වෙනුවට-

"අක්වෙරළ ව්‍යාපාර වෙනුවෙන්; සහ

(iii) වෙළෙඳපලට සකස් කිරීමේදී භාණ්ඩ ලේබල් කිරීම හෝ ඒවා නැවත ඇසුරුම් කිරීම හෝ ලේබල් කිරීම හැර භාණ්ඩ යම් සැකසුම් ක්‍රියාවලියකට හෝ නිෂ්පාදනයකට යටත්

කිරීමකින් තොරව නැවත අපනයනය කරන ලද්දාවූ ප්‍රහිත පදනමක් මත ශ්‍රී ලංකාවට ගෙන එන ලද භාණ්ඩ වන්නාවූ යම් භාණ්ඩ අපනයනය කිරීමේ ව්‍යාපාරයක් වෙනුවෙන්;

ඒ සමාගම විසින්";

(3) එම වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ආආ) කළමනාකරණය, මුදල් සැපයීම, සැපයුම් ක්‍රියාවලිය සහ බිල්පත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ස්වකීය ප්‍රධාන කාර්යාල පිහිටුවා ඇති යම් විදේශීය ගැනුම්කරුවකු වෙත කරන ලද සැපයුම් මඟින් යම් රෙදිපිළි නිෂ්පාදකයකු, හම් භාණ්ඩ, පාවහන් හෝ බෑග් නිෂ්පාදකයකු විසින් විදේශ ව්‍යවහාර මුදලින් උපයා ගන්නා ලද ලාභ සහ ආදායම;";

(4) "ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයේ යහපත උදෙසා" යන වචන වල සිට "යම් තැනැත්තෙකුට හෝ හවුල් ව්‍යාපාරයකට ලබාදෙන සේවාවක් වෙනුවෙන්" යන වචන දක්වාවූ සියලු වචන ඉවත්කර ඒ වෙනුවට "ශ්‍රී ලංකාවේදී සපයන ලද යම් සේවාවක් වෙනුවෙන් ලැබෙන යම් කොමිස් මුදලක්, වට්ටමක් හෝ වෙනත් යම් එවැනි සමාන ලැබීමක් හැර, ශ්‍රී ලංකාවේ යම් වාසික සමාගමක්, වාසික පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ශ්‍රී ලංකාවේදී හෝ ශ්‍රී ලංකාවෙන් පිටතදී, ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ලබාදෙන්නාවූ ඕනෑම සේවාවක් වෙනුවෙන්" යන වචන ආදේශ කිරීමෙන්;

(5) එම වගන්තියේ (ඛඛඛඛ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

(ඛඛඛඛඛ) (i) ශ්‍රී ලංකාවේ යම් බැංකුවක් හෝ වෙනත් මූල්‍ය ආයතනයක් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරනු ලබන මාර්ගෝපදේශ ප්‍රකාරව පවත්වාගෙන යනු ලබන සහ ක්‍රියාත්මක කරනු ලබන එකී බැංකුවේ හෝ ආයතනයේ ආයෝජන අරමුදල් ගිණුමේ බැරට ඇති මුදල්වලින්

ලබාදෙනු ලබන ණය මුදලක් සම්බන්ධයෙන්, එකී බැංකුවට හෝ මූල්‍ය ආයතනයට ගෙවිය යුතු පොලී මුදලට සමාන යම් මුදලක්; හෝ

(ii) ශ්‍රී ලංකාවේ යම් බැංකුවක් හෝ වෙනත් මූල්‍ය ආයතනයක් විසින් -

(අ) 17අ වගන්තියේ සඳහන් ව්‍යවසායක මුළුමනින්ම ආයෝජනය කිරීම සඳහා සමාගමකට ලබාදෙනු ලබන;

(ආ) "අතහැර දමා තිබී නැවත විවෘත කරන ලද යම් කර්මාන්ත ශාලාවක්" ක්‍රියාත්මක කිරීම සඳහා යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ලබාදෙනු ලබන,

කිසියම් ණය මුදලක් මත එකී බැංකුවට හෝ මූල්‍ය ආයතනයට ගෙවිය යුතු පොලී මුදලට සමාන යම් මුදලක්.

මේ ඡේදයේ "අතහැර දමා තිබී නැවත විවෘත කරන ලද යම් කර්මාන්ත ශාලාවක්" යන්නෙන් කිසියම් භාණ්ඩ හෝ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමෙහි හෝ සැදීමෙහි නිරතවූ එහෙත් 2010 නොවැම්බර් මස 22 වන දිනට පූර්වයෙන් අවුරුදු තුනකට නොඅඩු අඛණ්ඩ කාලයක් එම නිෂ්පාදනයේ නිරතව නොසිටි සහ 2012 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව එම භාණ්ඩය හෝ ද්‍රව්‍යය හෝ වෙනත් යම් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් වාණිජ ප්‍රමාණයෙන් නිෂ්පාදනය කිරීම හෝ සැදීම ආරම්භ කරන, කර්මාන්ත ශාලාවක් අදහස්වේ.";

(6) එම වගන්තියේ (මමම) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදයන් ඇතුළත් කිරීමෙන් :-

"(මමමම) ශ්‍රී ලංකාවේ යම් වරාය පර්යන්තයක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ යම් ව්‍යවසායකින් යම් තැනැත්තකුට උද්ගතවන හෝ උපචිත වන ලාභ සහ ආදායම්;

"(මමමමම) යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ශ්‍රී ලංකාවේ යම් වරායක් තුලදී එහි සීමාව ඇතුළත යම් ව්‍යාපාරයක් කරගෙන යන අතරතුරදී ඉටුකරනු ලබන කිසියම් සේවාවකින් ලබන ලාභ සහ ආදායම්;";සහ

(7) එම වගන්තියේ (යයයය) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(යයයයය) ශ්‍රී ලංකාවේ යම් වරායක් ඉදිකිරීම සඳහා වූ ව්‍යවසායකින් යම් තැනැත්තකුට උද්ගතවන හෝ උපචිතවන ලාභ සහ ආදායම්.".

16අ,16ආ, සහ 16ඇ යන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති පිළිවෙළින් එම ප්‍රඥප්තියේ 16අ වගන්තිය, 16ආ වගන්තිය සහ 16ඇ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය :-

"මාළු ඇල්ලීම සඳහා වූ ව්‍යවසායකින් ලබන ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

16අ. (1) ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යන්නාවූ යම් මාළු ඇල්ලීම සඳහා වූ ව්‍යවසායකින් 3 වන වගන්තියේ (ආ) ඡේදයේ අර්ථානුකූලව, යම් ප්‍රාග්ධන වත්කමක් බැහැර කිරීමෙන් හැර, යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් ලබන ලාභ සහ ආදායම, 2011 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භවන වසර පහක කාල පරිච්ඡේදය තුළ එක් එක් තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය.

(2) මෙම වගන්තියේ "මාළු ඇල්ලීමේ ව්‍යවසායය" යන්නට අල්ලන ලද මාළු වෙළෙඳපොල සඳහා සකස් කිරීමේදී පිරිසිදු කිරීම, ප්‍රමාණගත කිරීම, තේරීම, වර්ග කිරීම, ශීත කිරීම, විජලනය කිරීම, ඇසිරීම, ඡේදනය කිරීම හෝ භාජනවල ඇසිරීම සඳහාවූ යම් ව්‍යවසායක් ඇතුළත්වේ.

(3) යම් මාළු ඇල්ලීමේ ව්‍යාපාරයකින් සහ එම මාළු යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා වන ව්‍යාපාරයකින් සමන්විත වන යම් ව්‍යවසායයක් සම්බන්ධයෙන්, එකී මාළු විවෘත වෙළෙඳපොලේ

පවත්නා මිලට එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා විකුණනු ලැබූ බවට සැලකිය යුතු අතර, එසේ සලකනු ලබන විකිණීම සම්බන්ධයෙන් වන ලාභ සහ ආදායම සඳහා එකී ව්‍යවසායට (1) වන උපවගන්තිය යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම අදාළ විය යුතුය.

කෘෂිකාර්මික බීජ හෝ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා වන ව්‍යවසායකින් ලබන ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

16ආ. (1) කෘෂිකාර්මික බීජ හෝ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හෝ එම බීජ හෝ ද්‍රව්‍ය ප්‍රාථමිකව සැකසුම් කිරීම සඳහා වූ ව්‍යවසායකින් 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව, එහෙත් යම් ප්‍රාග්ධන වත්කමක් බැහැරකිරීමෙන් හැර, යම් තැනැත්තකු හෝ හවුල්ව්‍යාපාරයක් ලබන ලාභ සහ ආදායම 2011 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන වසර පහක කාල පරිච්ඡේදය තුළ එක් එක් තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) මෙම වගන්තියේ "ප්‍රාථමික සැකසුම් කිරීම" යන්නෙන්, වෙළඳපොල සඳහා සකස් කිරීමේ කාර්ය සඳහා පිරිසිදු කිරීම, ප්‍රමාණගත කිරීම, තේරීම, වර්ග කිරීම, ශීත කිරීම, විජලනය, ඡේදනය, භාජනවල ඇසිරීම හෝ ඇසිරීම අදහස් කෙරේ.

(3) යම් බීජ හෝ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයකින් සහ එම බීජ හෝ රෝපණ ද්‍රව්‍ය කෘෂිකර්මාන්තයේ හෝ උද්‍යාන වගාවේ යොදාගන්නා යම් ව්‍යවසායක් සම්බන්ධයෙන්, එකී බීජ හෝ රෝපණ ද්‍රව්‍ය විවෘත වෙළෙඳපොලේ පවත්නා මිලට එම කෘෂිකර්මාන්තය හෝ උද්‍යාන වගාව සඳහා විකුණනු ලැබූ බවට සැලකිය යුතු අතර, එසේ සලකනු ලබන විකිණීම සම්බන්ධයෙන් වන ලාභ සහ ආදායම සඳහා එකී ව්‍යවසායට (1) වන උපවගන්තියේ සඳහන් නිදහස් කිරීම අදාළ විය යුතු ය.

රුපියල් මිලියන පනහකට නොඅඩු ආයෝජනයක් කරමින් කරනු ලබන අලුත් ව්‍යවසායයක ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

16ඇ. (1) යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව කරගෙනයනු ලබන්නාවූ (2) වන උපවගන්තියේ දක්වා ඇති අලුත් ව්‍යවසායකින් ලබන, ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන ලාභ නොවන, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ ලාභ සහ ආදායම්, එළඹුනු ගනුදෙනුවලින් ව්‍යවසායේ ලාභ ලැබීම ආරම්භවූයේ කුමන තක්සේරු වර්ෂයකද, එම තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට හෝ එම ව්‍යවසායය වාණිජ කටයුතු ආරම්භ කළ දින සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකක කාල සීමාවක් සම්පූර්ණවන තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂය ආරම්භයේ සිට යන වර්ෂ දෙකෙන් කලින් එළඹෙන වර්ෂයේ සිට වර්ෂ තුනක කාලසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "අලුත් ව්‍යවසායක්" යන්නෙන් -

(අ) මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන නොවන යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ නිරතව සිටින;

(ආ) 2011 නොවැම්බර් මස 22 වන දිනට පසුව, එහෙත් 2012 මාර්තු මස 31 වන දිනට පෙරාතුව, රුපියල් මිලියන පනහකට නොඅඩු මුදලක් එහි ස්ථාවර වත්කම් අත්පත්කරගැනීම සඳහා ආයෝජනය කරන; සහ

(ඇ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව වාණිජ කටයුතු ආරම්භ කරන,

යම් ව්‍යවසායයක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. 2009 අංක 19 දරන පනත මඟින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය එහි (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන අනු ඡේදයේ "2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව සංස්ථාගත කරන ලද" යන වචන හා ඉලක්කම් වෙනුවට "2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, නමුත් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සංස්ථාගත කරන ලද" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් එකී වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය :— 17අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"නියම කරනු ලබන ක්‍රියාකාරකම් වල නිරත අලුත් ව්‍යවසායක ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

17අ. (1) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන (2) වන උපවගන්තියේ සඳහන් අලුත් ව්‍යවසායකින් එම සමාගමේ ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු ලාභ සහ ආදායම් හැර, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ ලාභ සහ ආදායම්, එම ව්‍යවසායය එළඹුණු ගනුදෙනුවලින් ලාභ ලැබීම ආරම්භ කළ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට හෝ එම ව්‍යවසායය වාණිජ කටයුතු ආරම්භ කළ දින සිට ගණන් බලනු ලබන වසර දෙකක කාලසීමාවක් සම්පූර්ණ වන තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට, යන මෙයින් කලින් එළඹෙන වර්ෂයේ සිට අවුරුදු පහක කාලසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය:

එසේ වුව ද, එකී ව්‍යවසායයක ආයෝජනය කරනු ලබන මුදල් ඇමෙරිකානු ඩොලර් මිලියන තුනකට හෝ සමාන මුදලකට වැඩිවන අවස්ථාවකදී රටේ ආර්ථික සංවර්ධනය සැලකිල්ලට ගෙන, අමාත්‍යවරයා විසින් එම පදනම මතම වසර හතකට නොවැඩි කාලයක් සඳහා බද්දෙන් නිදහස් කාල පරිච්ඡේදයක් ලබා දිය හැකිය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, "අලුත් ව්‍යවසායයක්" යන්නෙන් - ඇමෙරිකානු ඩොලර් මිලියන තුනකට හෝ අනෙකුත් මුදල් ඒකකයන්ගෙන් ඊට සමාන මුදලකට නොඅඩු මුදලක් ආයෝජනය කරමින් රටේ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය කරන ජාතික ආර්ථික සංවර්ධනය සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ක්‍රියාකාරකම්වල නිරතවන ව්‍යවසායයක් අදහස්වේ.".

**10.** 2008 අංක 9 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම උපවගන්තියේ (ඇ) ඡේදයේ "2009 අප්‍රේල් මස 1" යන වචන හා ඉලක්කම් වෙනුවට, "2010 අප්‍රේල් මස 1" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයේ "2009 අප්‍රේල් මස 1 වන දිනට" යන වචන හා ඉලක්කම් වෙනුවට "2010 අප්‍රේල් මස 1 වන දිනට" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** 2008 අංක 9 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "2009 මාර්තු මස 31 වන දිනට" යන වචන හා ඉලක්කම් වෙනුවට "2010 මාර්තු මස 31 වන දිනට" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "2009 මාර්තු මස 31 වන දිනට ප්‍රථම" යන වචන හා ඉලක්කම්වල සිට "එම තක්සේරු වර්ෂය පුරාම-" යන වචන දක්වා වූ සියලුම වචන හා ඉලක්කම් වෙනුවට පහත සඳහන් වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"කොළඹ සහ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්ක වලින් පිටත නැවත ස්ථානගත කරනු ලැබුවාවූ සහ 2010 මාර්තු මස 31 වන දින පසුවීමට පෙරාතුව ආරම්භව-".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධන කිරීම.

**13.** 2008 අංක 9 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ තවදුරටත් වූ අතුරු විධානයේ "අවුරුදු තුනක් විය යුතුය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"අවුරුදු තුනක් විය යුතුය :

එසේ වුවද, තවදුරටත් යම් අවදානම් ප්‍රාග්ධන සමාගමක් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව මෙම උපවගන්තියේ (අ),(ආ) හෝ (ඇ) ඡේදයේ දැක්වෙන යම් ව්‍යාපෘතියක සාමාන්‍ය කොටස් මිලදී ගැනීම සඳහා කිසියම් ආයෝජනයක් කර නොමැත්තේ නම්, එකී සමාගම මෙම වගන්තිය යටතේ යම් බදු නිදහසකට හිමිකම් නොලැබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** 2009 අංක 19 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :-

(1) එම උපවගන්තියේ (අ) ඡේදයේ -

(අ) (iii) වන අනු ඡේදයේ "(v) වන අනුඡේදයේ සඳහන් නොවන, එම තැනැත්තා විසින් අත්කරගත් හෝ

එකලස් කරන ලද යම් පිරියත, එසේ අත්කරගැනීමේ හෝ එකලස් කිරීමේ වියදම මත වර්ෂයකට සියයට දොළහමාරක අනුප්‍රමාණයට;" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් :-

"(iv) වන අනුඡේදයේ සඳහන් නොවන යම් පිරියත එම තැනැත්තා විසින් :-

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අත්පත් කරගත්තේ හෝ එකලස් කරන ලද්දේ නම්, එසේ අත්පත් කරගැනීමේ හෝ එකලස් කිරීමේ වියදම මත වර්ෂයකට සියයට දොළහමාරක අනුප්‍රමාණයට; හෝ

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව අත්පත් කරගන්නේ හෝ එකලස් කරන ලද්දේ නම්, එසේ අත්පත් කරගැනීමේ හෝ එකලස් කිරීමේ වියදම මත වර්ෂයකට සියයට තිස්තුනයි තුනෙන් එකක අනුප්‍රමාණයකට;" ;

(ආ) එම ඡේදයේ v වන අනුඡේදයේ, "යම් සුදුසුකම් ලැබූ ගොඩනැගිල්ලක්" යන වචන වෙනුවට "2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ඉදිකරන ලද යම් සුදුසුකම් ලැබූ ගොඩනැගිල්ලක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) එම ඡේදයේ v වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(vi) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ඉදිකරන ලද සුදුසුකම් ලැබූ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ වියදම මත වර්ෂයට සියයට දහයක අනුප්‍රමාණයට;";

(ඈ) එම ඡේදයේ අතුරු විධානයේ (ආ) ඡේදයේ,

(i) (i) වන අනුඡේදයේ "අත්කරගත් යම් පිරියත හෝ යන්ත්‍රෝපකරණ," යන වචන වෙනුවට "2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අත්පත්කරගත් යම් පිරියත හෝ යන්ත්‍රෝපකරණ," යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ii) (ii) වන අනුඡේදයේ, "2007 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව අත්කර ගන්නා වූද" යන වචන හා ඉලක්කම් වෙනුවට "2007 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, නමුත් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අත්කර ගන්නාවූද" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (එ) ඡේදයේ "ඒ තැනැත්තා විසින් දරන ලද ප්‍රාග්ධන වියදම් ඇතුළුව වියදම්" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :-

"ඒ තැනැත්තා විසින් -

(i) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා දරන ලද ප්‍රාග්ධන වියදම් ඇතුළුව වියදම්; හෝ

(ii) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා දරන ලද ප්‍රාග්ධන වියදම් ඇතුළුව වියදම්වලින් සියයට දෙසීයකට සමාන යම් ප්‍රමාණයක්;

(3) එම උපවගන්තියේ (ඩ) ඡේදයේ "දරන ලද ප්‍රතීතන වියදම්", යන වචන සහ ඉලක්කම් වෙනුවට "දරන ලද ප්‍රතීතන වියදම්;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) එම උපවගන්තියේ (ඩ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ඬ) සමාගමක් විසින් එහි යම් කොටස් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනුමත කොටස් හුවමාරු ස්ථානයක යම් නිල ලැයිස්තුවක ලැයිස්තුගත කිරීමේදී යම් තක්සේරු වර්ෂයකදී දරන ලද වියදම් සහ ඊට පෙරාතුව යම් තක්සේරු වර්ෂයකදී දරන ලද එවැනි වියදම්වල මුළු එකතුව, එම සමාගමේ මුල් මහජන කොටස් නිකුතුවේ අගයෙන් සියයට එකක් නොඉක්මවන තාක්දුරට එම තක්සේරු වර්ෂයේදී සමාගම විසින් දරන ලද එකී කොටස් නිල ලැයිස්තුගත කිරීමේ වියදම්.".

**15.** 2008 අංක 9 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (ඇ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "පිටත ගමන් බිමන් සඳහා දරන ලද වියදම්;" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:—

"පිටත ගමන් බිමන් සඳහා දරන ලද වියදම් :

එසේ වුවද, 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා -

(අ) ඒ තැනැත්තා විසින්—

(i) යම් භාණ්ඩයක හෝ ද්‍රව්‍යයක අපනයන වෙළෙඳාම නංවාලීම හෝ විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් කිරීම සඳහා යම් සේවාවක් සැපයීමේදී දරන ලද වියදම්; හෝ

(ii) (ඇ) ඡේදයේ සඳහන් පරිදි අනුමත වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා දරන ලද වියදම්; හෝ

(ආ) එම වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ ඊට පෙරාතුවම වූ තක්සේරු වර්ෂයේ ලාභ සහ ආදායම් වලින් සියයට දෙකකට සමාන ප්‍රමාණයක්,

යන්නෙන් අඩු ප්‍රමාණය, එම වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ එකී තක්සේරු වර්ෂය සඳහා ලාභ සහ ආදායම නිශ්චය කිරීමේදී අඩු කරනු ලැබිය යුතුය;";

(2) (ඩ) ඡේදයේ (i) වන අනුඡේදයේ "රුපියල් දසලක්ෂයක්" යන වචන වෙනුවට "රුපියල් දස ලක්ෂ දෙකක්" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම උපවගන්තියේ (න) ඡේදයේ "එම තැනැත්තාගේ වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් ගාස්තුවලින් හරි අඩක්" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් :-

"යම් තක්සේරු වර්ෂයක් සඳහා එම තැනැත්තාගේ වෙළෙඳ ප්‍රචාරක වියදම්වලින් -

(i) එකී තක්සේරු වර්ෂය 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් වන විට, හරි අඩක්; සහ

(ii) එකී තක්සේරු වර්ෂය 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් වන විට, හතරෙන් එකක්;";

(4) එම උප වගන්තියේ (ම) ඡේදයේ "අරමුදල් රැස්කිරීම ඇතුළත්වේ"; යන වචන වෙනුවට "අරමුදල් රැස්කිරීම ඇතුළත්වේ;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(5) එම උපවගන්තියේ (ම) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :-

"(ය) යම් සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කර ඇති යම් සේවා නියුක්තිකයකුගේ සේවා නියුක්ත ආදායම වෙනුවෙන් එම සේවා යෝජකයා විසින් ගෙවනු ලබන ආදායම් බද්ද.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** 2008 අංක 9 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (3) වන උපවගන්තියෙහි -

(අ) (උ) ඡේදයේ "අඩු කරගනු ලැබුවාවූද පොලිය; සහ" යන වචන වෙනුවට "අඩුකරගනු ලැබුවාවූද පොලිය;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ඌ) ඡේදයේ "මැණික් විකිණීමකින් ලබන ලාභ සහ ආදායම්" යන වචන වෙනුවට "මැණික් විකිණීමකින් ලබන ලාභ සහ ආදායම්; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) එම උපවගන්තියේ (ඌ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :-

"(එ) පුද්ගලයකු වශයෙන් යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙහි කොටසක් නොවන ලෙසට මෙම වගන්තියෙහි සඳහන් කොට ඇති යම් ආදායමක් හැර, වෙනත් යම් ආදායමක් නොමැති තැනැත්තකුගේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ දැක්වෙන ලාභ හැර, 114 වන වගන්තිය යටතේ සේවායෝජකයා විසින් ආදායම් බදු අඩු කරනු ලබන යම් සේවා නියුක්තියකින් ලැබෙන ලාභ.";

(2) එම වගන්තියේ (5) වන උපවගන්තියේ (අ) ඡේදයේ අතුරු විධානයේ (iv) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන් :-

"(v) මුළු ව්‍යවස්ථාපිත ආදායමෙහි ඇතුළත් යම් සේවා නියුක්ති ආදායමකින්, මෙම වගන්තිය යටතේ කිසිදු අඩු කිරීමක් කරනු නොලැබිය යුතු ය ;".

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම උපවගන්තියේ (අ) ඡේදයේ "රුපියල් තුන් ලක්ෂයක දීමනාවක්; සහ" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් :-

"(i) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් ලක්ෂ තුනක; සහ

(ii) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් ලක්ෂ පහක

දීමනාවක්; සහ";

(2) එම උපවගන්තිය සඳහා වූ අතුරු විධානයේ "අඩුකිරීමට ඔහුට හිමිකම් නොලැබිය යුතුය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඃ-

"අඩුකිරීමට ඔහුට හිමිකම් නොලැබිය යුතුය ඃ

එසේ වුවද, තවදුරටත් 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භවන්නා වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා-

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් පුද්ගලයකු ඒ පුද්ගලයා ශ්‍රී ලංකාවේ වාසිකයකු වූයේද, නොවූයේ ද, (අ) ඡේදයේ සඳහන් දීමනාවට හිමිකමක් ලබයි;

(ii) තක්සේරු කළ හැකි ආදායමට ඇතුළත් කර ඇති යම් සේවා නියුක්ත ආදායමකින්, 34 වන වගන්තිය යටතේ යම් දීමනාවක කොටසක් අඩු කිරීම සඳහා යම් පුද්ගලයකුට හිමිකමක් නොතිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

18. 2009 අංක 19 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) (අ) ඡේදයේ "යම් තැනැත්තකු විසින් අනුමත පුණ්‍යායතනයකට මුදලින් කරන ලද" යන වචන වෙනුවට "යම් තැනැත්තකු විසින්, රෝගී හෝ දිළිඳු තැනැත්තන් සඳහා ආයතනිකමය රැකවරණය සැලසීම වෙනුවෙන් ස්ථාපිත පුණ්‍යායතනයක් වන අනුමත පුණ්‍යායතනයකට මුදලින් කරන ලද" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ඈ) ඡේදයේ "දායක මුදල් වශයෙන් යම් පුද්ගලයකු විසින් ගෙවනු ලැබූ" යන වචන වෙනුවට "දායක මුදල් වශයෙන් යම් පුද්ගලයකු විසින් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ගෙවනු ලැබූ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) (ඉ) ඡේදයේ "පුද්ගලයකු විසින් ගෙවන ලද යම් දායක මුදල්" යන වචන වෙනුවට "පුද්ගලයකු විසින් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ගෙවන ලද යම් දායක මුදල්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඈ) (ඊ) ඡේදයේ "මුදලින් කරන ලද ත්‍යාගයක්;" යන වචන වෙනුවට, "2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර මුදලින් කරන ලද ත්‍යාගයක්;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඉ) (උ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "වෛද්‍ය රක්ෂණ ඔප්පුවක් සඳහා" යන වචන වෙනුවට පහත සඳහන් වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් :-

"(ඌ) ඡේදයේ දැක්වෙන යම් ඔප්පුවක් හැර වෙනත් වෛද්‍ය රක්ෂණ ඔප්පුවක් සඳහා "

(ඊ) එම උපවගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ඌ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකදී ගෙවන ලද්දාවූද, සුවකළ නොහැකි රෝග ආවරණය වන්නාවූ විශේෂ සෞඛ්‍ය රක්ෂණ ඔප්පුවක් මත ගෙවිය යුතු වන්නාවූ, වාරික මුදල්;";

(උ) (එ) ඡේදයේ "ඉදිකිරීම හෝ මිලට ගැනීම සඳහා දරන ලද වියදමක්" යන වචන වෙනුවට, "ඉදිකිරීම හෝ මිලට ගැනීම සඳහා 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව දරන ලද වියදමක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඌ) (ඒ) ඡේදයේ "මුල මුදල ආපසු ගෙවීම සඳහා දරන ලද යම් වියදමක්" යන වචන වෙනුවට, මුලු මුදල ආපසු ගෙවීම සඳහා 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව දරන ලද වියදමක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ "උපවගන්තියේ (අ),(ආ), (ඇ),(ඉ), (උ),(ඌ)" යන වචන වෙනුවට "උපවගන්තියේ (අ),(ආ),(ඇ),(ඉ),(උ),(උඋ),(ඌ)" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** 2007 අංක 10 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "ශ්‍රී ලංකාවේ දී උපචිත වන ලාභ සහ ආදායම්" යන වචන වෙනුවට "2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ශ්‍රී ලංකාවේ දී උද්ගත වන ලාභ සහ ආදායම්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** 2007 අංක 10 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"(අඅ) සත්ව ආහාර නිෂ්පාදනය කිරීම සඳහා වූ ව්‍යාවසායකින්;";

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** 2008 අංක 9 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අඅ) සත්ව ආහාර නිෂ්පාදනය කිරීම සඳහා වූ ව්‍යාවසායකින්;";

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන වෙනුවට "2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

48අ යන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"16 වන වගන්තිය යටතේ බදු නිදහස අවසන් වූ පසුව, ආදායම් බදු අනුප්‍රමාණය

48අ. 2011 අප්‍රේල් මස 1 වන දිනෙන් හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ බදු අයවන ආදායමෙහි ඇතුළත් 16 වන වගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් ලැබූ ලාභ සහ ආදායම, මේ පනතේ වෙනත් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව තිබුණද, පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණයට අනුව ආදායම් බද්දට යටත් කළ යුතුය.".

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති පිළිවෙළින් ප්‍රධාන ප්‍රඥප්තියේ 59අ සහ 59ආ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :—

59අ සහ 59ආ යන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"දේශීය අගය වැඩිකිරීම සියයට හැටපහ ඉක්මවන සමහර භාණ්ඩ නිපදවා අපනයනය කිරීමෙන් හෝ අපනයනකරුවකුට සැපයීමෙන් ලබන ලාබ මත ආදායම් බදු අනුප්‍රමාණ.

59අ. 2011 අප්‍රේල් මස 1 වන දිනෙන් හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා දේශීය අගය වැඩිකිරීම සියයට හැටපහක් ඉක්මවන සහ පේටන්ට් හිමිකම ශ්‍රී ලංකාවේ පවතින යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යවසායක නිරත යම් තැනැත්තකුගේ එකී භාණ්ඩ අපනයනය කිරීමෙන් හෝ අපනයනය කිරීම සඳහා වෙනත් තැනැත්තකුට සැපයීමෙන් ලබන ලාභ සහ ආදායම, මේ පනතේ වෙනත් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණයෙන් ආදායම් බද්දට යටත් කළ යුතු ය.

වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන තුන්සියය නොඉක්මවන යම් ව්‍යවසායකට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය.

59ආ. (1) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා (2) වන උපවගන්තියේ සඳහන් කර ඇති ව්‍යවසායකින් යම් තැනැත්තකු විසින් ලබන ලාභ සහ ආදායම, මේ පනතේ වෙනත් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණයට අනුව ආදායම් බද්දට යටත් කළ යුතු ය.

(2) මෙම වගන්තියේ කාර්ය සඳහා (1) වන උප වගන්තියේ සඳහන් කර ඇති යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් "ව්‍යවසාය" යන්නෙන් -

(අ) යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ හෝ සේවාවක් සැපයීමේ නිරත; සහ

(ආ) එම තක්සේරු වර්ෂය සඳහා (ප්‍රාග්ධන භාණ්ඩ විකිණීමෙන් හැර) ලබන පිරිවැටුම රුපියල් මිලියන තුන්සියය නොඉක්මවන යම් ව්‍යවසායක් අදහස්වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

**25.** 2008 අංක 9 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (අ) ඡේදයේ "මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන්" යන වචන වෙනුවට "අවස්ථාවෝචිත පරිදි, මේ පනතේ දෙවන උපලේඛනයේ හෝ පස්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (ආ) ඡේදයෙහි -

(අ) එම ඡේදයේ (ii) වන අනුඡේදයේ "එම සමාගම විසින් එම තක්සේරු වර්ෂයට පෙරාතුවම වූ වර්ෂයේදී" යන වචනවල සිට "ලාභයෙන් සියයට

තිස්තුනයි තුනෙන් එකෙහි" යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :-

"එම සමාගම විසින්-

(අ) එම තක්සේරු වර්ෂය 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන විට, එම තක්සේරු වර්ෂයට පෙරාතුවම වූ වර්ෂයේදී (මෙහි මින්මතු "පෙරාතුවම වූ වර්ෂය" ලෙස සඳහන් කරනු ලබන) එම පෙරාතුවම වූ වර්ෂය සඳහා බෙදාහැරිය හැකි ලාභයෙන් එම පෙරාතුවම වූ වර්ෂය ආරම්භවී මාස දහ අටක කාලයක් ඇතුළත, සියයට විසි පහකට වඩා අඩු ලාභාංශ ප්‍රමාණයක් බෙදා හැර ඇති අවස්ථාවකදී; හෝ

(ආ) එම තක්සේරු වර්ෂය 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් වන විට, එම තක්සේරු වර්ෂයට පෙරාතුවම වූ වර්ෂයේදී (මෙහි මින්මතු පෙරාතු වර්ෂය ලෙස සඳහන් කරනු ලබන) එම පෙරාතුවම වූ වර්ෂය සඳහා බෙදා හැරිය හැකි ලාභයෙන් එම පෙරාතුවම වූ වර්ෂය ආරම්භවී මාස දහඅටක කාලයක් ඇතුළත සියයට දහයකට වඩා අඩු ලාභාංශ ප්‍රමාණයක් බෙදාහැර ඇති අවස්ථාවකදී,

එම පෙරාතුවම වූ වර්ෂය සඳහා එම සමාගමේ බෙදාහැරිය හැකි ලාභයෙන් සියයට තිස්තුනයි තුනෙන් එකහෙි" සහ

(ආ) (ii) වන අනුඡේදයේ අතුරු විධානයේ "එම තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ බෙදාහැරිය හැකි ලාභයෙන් සියයට විසි පහක්" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් :-

"එම තක්සේරු වර්ෂය සඳහා -

(අ) එම තක්සේරු වර්ෂය 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන විට, ඒ සමාගමේ බෙදාහැරිය හැකි ලාභයෙන් සියයට විසි පහක්; හෝ

(ආ) එම තක්සේරු වර්ෂය 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භවන වර්ෂයක් වන විට, ඒ සමාගමේ බෙදාහැරිය හැකි ලාභයෙන් සියයට දහයක්".

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

**26.** 2009 අංක 19 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභ බෙදීමේ අනුප්‍රමාණය ප්‍රයෝජනයට ගනිමින්" යන වචන වෙනුවට "යම් තක්සේරු වර්ෂයක් සඳහා හවුල් ව්‍යාපාරයෙන් ලැබූ යම් වැටුපක්ද ඇතුලුව ලාභ කොටස්වල අනුපාතය යොදාගනිමින්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තිය සංශෝධනය කිරීම.

**27.** 2008 අංක 9 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම උපවගන්තියේ අතුරු විධානයේ (අඅ) ඡේදයේ "අනුප්‍රමාණයට අනුව විය යුතුය; සහ" යන වචන වෙනුවට "අනුප්‍රමාණයට අනුව විය යුතුය;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම අතුරු විධානයේ (අඅ) ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(අඅඅ) මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් යම් පොලියකින් මේ වගන්තිය යටතේ අඩුකිරීමක් නොකළ යුතුය; සහ".

ප්‍රධාන ප්‍රඥප්තියේ XI වන පරිච්ඡේදයට නව ශීර්ෂයක් සහ 105අ නව වගන්තිය ඇතුළත් කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ XI වන පරිච්ඡේදයේ 105 වන වගන්තියට ඉක්බිතිව ම පහත නව ශීර්ෂය සහ අලුත් වගන්තිය ඇතුළත් කරන අතර එම වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 105අ වගන්තිය ලෙස බල පැවැත්විය යුතු ය :—

ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනු මත පැනනගින ලාභ සහ ආදායම්, බද්දට යටත් වේ.

"ක - ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනු

105අ. (1) ඉස්ලාමීය මූල්‍ය සාධන පත්‍රයකට අදාළව යම් ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවකින් උද්ගත වන ලාභ සහ ආදායම් මෙම පනතේ විධිවිධාන යටතේ මෙම වගන්තියේ දක්වා ඇති ආකාරයෙන් බද්දට යටත් වේ.

(2) ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවකින් යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට උද්ගත වන ලාභ සහ ආදායම, එම ගනුදෙනු මෙම පනතේ විධි විධානවලට අනුව කවර හෝ සම්ප්‍රදායික මූල්‍ය ගනුදෙනුවක් හා සමාන හෝ භාවාර්ථයෙන් තුල්‍ය වන විට, එම සම්ප්‍රදායික මූල්‍ය ගනුදෙනු බද්දට යටත් වන ආකාරයෙන්ම යටත් විය යුතු ය.

(3) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින්, යම් නිශ්චිත ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවකින් පැන නගින සැපයුම් අගය බද්දට යටත් විය යුත්තේ කවර ප්‍රමාණයකට ද යන්න තීරණය කිරීම සඳහා -

(අ) ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවකට තුඩු දෙන්නා වූ අවස්ථානුගත කරුණු හඳුනා ගැනීමේ කාර්ය සඳහා ; සහ

(ආ) යම් ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවකින් පැන නගින සැපයුම් අගය සොයා දැන ගැනීම සඳහා,

අවශ්‍ය විය හැකි පරිදි, කලින් කල, රීති සහ මාර්ගෝපදේශ නිකුත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය සංශෝධනය කිරීම.

**29.** 2009 අංක 19 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "ආදායම් බදු අඩුකරගෙන තිබෙන විටක." යන වචන වෙනුවට "ආදායම් බදු අඩුකරගෙන තිබෙන විටෙකඃ

එසේ වුවද, තවදුරටත්, 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා සේවා නියුක්තයකු වන පුද්ගලයකුට (ආ) අනුඡේදයේ හෝ (ඇ) අනුඡේදයේ දැක්වෙන යම් ආදායමක් හැරුණුකොට, ආදායම් බද්දට බැඳෙන වෙනත් ආදායමක් නොමැත්තේ නම්, එම පුද්ගලයා සම්බන්ධයෙන් පෙර සඳහන් විධිවිධාන අදාළ නොවිය යුතුය.";

(2) එම වගන්තියේ (11) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(11) යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් එකක හෝ ව්‍යවසායන් ගණනාවකින් සමන්විත යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක්, අවස්ථාවෝචිත පරිදි, එක වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් ලෙසට කරගෙන යන්නේ නම් හෝ එකී තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය වෙළෙඳාම්, ව්‍යාපාර, වෘත්තීන් හෝ රක්ෂා එකකට වැඩිය කරගෙන යන්නේ නම් සහ ඒ වෙළෙඳාම්, ව්‍යාපාර, වෘත්තීන් හෝ රක්ෂාවලින් ලැබෙන ලාභ සහ ආදායම්, බද්දෙන් නිදහස් හෝ විවිධ අනුප්‍රමාණ අනුව බදු ගෙවීමට යටත් වන්නේ නම්, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් අවස්ථාවෝචිත පරිදි, එක් එක් ඒකකයෙන්, ව්‍යවසායෙන්, හෝ ක්‍රියාකාරකමෙන් ලබන ලාභ සහ ආදායම් වෙන වෙනම පිළිබිඹුවන පරිදි ගිණුම් වාර්තා පවත්වාගෙන යාම සහ සකස් කිරීම කළ යුතු වේ."; සහ

(3) එම වගන්තියේ (18) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :-

"(19) කොමසාරිස් ජනරාල්වරයා විසින්, යම් පුද්ගලයකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, ඒ පුද්ගලයා සම්බන්ධයෙන් 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව පවත්වාගෙන යනු ලබන වාර්තා, ඒ පුද්ගලයාගේ සියලු ලාභ සහ ආදායම්, බදු ගෙවනු ලබන ප්‍රභවයන්ගෙන් පමණක් උද්ගත වන බවට සහ එකී බද්ද අවසාන බද්දක් බවට සෑහීමකට පත්වන්නේ නම්, කොමසාරිස් ජනරාල්වරයාට එම වාර්තා වසා දැමිය හැකිය.".

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "වටිනාකමින් සියයට දහයක අනුප්‍රමාණයකට ආදායම් බදු අඩුකළ යුතුය." යන වචන වෙනුවට පහත සඳහන් වචන ආදේශ කිරීමෙන් :- ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය සංශෝධනය කිරීම.

"වටිනාකමින්, එකී මුදල් සහ ප්‍රතිලාභවල වටිනාකමෙහි එකතුව-

(අ) මසකට රුපියල් විසිපන්දහසක් නොඉක්මවයි නම්, සියයට දහයක අනුප්‍රමාණයකට; හෝ

(ආ) මසකට රුපියල් විසිපන්දාහක් ඉක්මවයි නම්, සියයට දාසයක අනුප්‍රමාණයකට; හෝ

ආදායම් බදු අඩු කළ යුතුය.".

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත්කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 117අ වගන්තිය ලෙස බල පැවැත්විය යුතුය :- 117අ යන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"පුද්ගලයකුට සේවා නියුක්තීන් එකකට වඩා ඇතිවිට විශේෂ අනුප්‍රමාණයකින් බදු අඩුකිරීම.

117අ. (1) සේවායෝජකයකු විසින් යම් සේවා නියුක්තයකුට පාරිශ්‍රමික ගෙවීම සහ ප්‍රතිලාභ සැපයීම කරනු ලබන්නේද, එකී සේවානියුක්තයා වෙනත් යම් සේවායෝජකයකු යටතේද සේවානියුක්තව සිටින්නේ නම්, ඒ සේවායෝජකයා විසින් එකී සේවා නියුක්තයාගේ පාරිශ්‍රමික වලින් ප්‍රධාන සේවායෝජකයා වශයෙන් 114 වන වගන්තිය යටතේ ආදායම් බදු අඩුකරන්නේ නම්, එවිට පළමුව සඳහන් කළ සේවායෝජකයා විසින් මෙම පරිච්ඡේදයේ විධිවිධාන අනුව එකී පාරිශ්‍රමික සහ ප්‍රතිලාභවල වටිනාකමින් එහි එකතුව -

(අ) මසකට රුපියල් විසිපන්දහක් නොඉක්මවයි නම්, සියයට දහයක අනුප්‍රමාණයකට; හෝ

(ආ) මසකට රුපියල් විසිපන්දහක් ඉක්මවයි නම්, සියයට දාසයක අනුප්‍රමාණයකට,

ආදායම් බදු අඩුකළ යුතුය. එකී ගෙවීම් හෝ ප්‍රතිලාභවල අගය සම්බන්ධයෙන්, 118 වන වගන්තිය යටතේ විධානයක් නිකුත් කිරීම හෝ භාරගැනීම නොකළ යුතු ය.

(2) මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, (1) වන උපවගන්තිය ප්‍රකාරව අඩුකරනු ලබන ආදායම් බද්දට අදාළව මේ පනත යටතේ මුදල් ආපසු ගෙවීමක් නොකළ යුතු නමුත්, එම මුදල් හෝ ප්‍රතිලාභවල වටිනාකම එම වර්ෂයේ ඔහුගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමට ඇතුළත් කොට ඇතිනම්, එම තක්සේරු වර්ෂය සඳහා එම තැනැත්තා විසින් ගෙවිය යුතු ආදායම් බද්දට එකී අඩු කරනු ලැබූ බද්ද හිලව් කරනු ලැබිය හැකිය.

(3) 116 වන වගන්තියේ සඳහන් බදු චක්‍ර යොදාගනිමින් යම් පාරිශ්‍රමිකයකින් ආදායම් බදු අඩු කිරීමට නියමවී ඇති යම් සේවා යෝජකයකු විසින් එසේ නොකර එම පාරිශ්‍රමික මත සියයට දහයක අනුප්‍රමාණයට බදු අඩුකරන අවස්ථාවක, 116 වන වගන්තියේ විධිවිධාන වලට අනුව බදු චක්‍ර යටතේ ගෙවිය යුතු බද්ද සහ මේ වගන්තිය යටතේ අඩුකර ඇති බද්ද අතර වෙනස එකී සේවායෝජකයා විසින් ගෙවිය යුතුය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය සංශෝධනය කිරීම.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා තමා" යන වචනවල සිට "අඩු කළ යුතුව තිබූ ප්‍රමාණයට වඩා ආදායම් බද්ද අඩු කරනු ලැබ ඇත්නම්" යන සියලු වචන වෙනුවට "යම් තක්සේරු වර්ෂයක් සඳහා එම මුළු පාරිශ්‍රමිකය හෝ ඉන් කොටසක් මේ පනතේ යම් විධිවිධානයක් යටතේ ආදායම් බද්දෙන් නිදහස් නම්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 131 වන වගන්තිය සංශෝධනය කිරීම.

**33.** 2008 අංක 9 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 131 වන වගන්තියේ "සේවා යෝජකයා" යන අර්ථ නිරූපණයේ "යම් පුද්ගල මණ්ඩලයක් හෝ XV වන පරිච්ඡේදයේ සඳහන් ආණ්ඩුවේ ආයතන හැර, යම් සංවිධානයක්" යන වචන වෙනුවට ඒ වචන යෙදෙන සෑම තැනකම "යම් පුද්ගල මණ්ඩලයක් හෝ යම් සංවිධානයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 132අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 132අ වගන්තියේ (1) වන උපවගන්තියේ "2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන හා ඉලක්කම් වෙනුවට "2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව එහෙත් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

35. 2009 අංක 19 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තියේ (4) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(අ) (i) යම් පුණ්‍ය ආයතනයක් හැර, සමාගමක් වන විටදී, අඩු කළ යුතු මුදල එම පොලියෙන් සියයට දහයක අනුප්‍රමාණයක් අනුව විය යුතුය ; සහ

(ii) යම් පුණ්‍ය ආයතනයක් හැර, හවුල් ව්‍යාපාරයක් හෝ පුද්ගල මණ්ඩලයක් වන විටදී, අඩු කළ යුතු මුදල එම පොලියෙන් සියයට අටක අනුප්‍රමාණයක් අනුව විය යුතුය ;";

(2) එම උපවගන්තියේ (ආ) ඡේදයේ -

(අ) (i) වන අනුඡේදයේ "රුපියල් 3,00,000ක් නොඉක්මවන" යන වචන හා ඉලක්කම් වෙනුවට "රුපියල් 500,000ක් නොඉක්මවන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) (ii) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(ii) රුපියල් 500,000ක් ඉක්මවන බවට ලිඛිත ප්‍රකාශයක් කරනු ලැබූ අවස්ථාවක, එම තක්සේරු වර්ෂය සඳහා එකී පුණ්‍යායතනයකට ගෙවිය යුතු පොලියෙන් සියයට අටක අනුප්‍රමාණයකට මුදලක් අඩුකරනු ලැබිය යුතුය;";

(3) එම උපවගන්තියේ (ඇ) ඡේදයේ -

(අ) (i) වන අනුඡේදයේ "රුපියල් 3,00,000ක් නොඉක්මවන" යන වචන හා ඉලක්කම් වෙනුවට "රුපියල් 500,000ක් නොඉක්මවන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) (ii) වන අනු ඡේදයේ "රුපියල් 300,000ක් ඉක්මවන එහෙත් රුපියල් 1,000,000ක් නොඉක්මවන" යන වචන හා ඉලක්කම් වෙනුවට "රුපියල් 500,000ක් ඉක්මවන එහෙත් රුපියල් 1,500,000ක් නොඉක්මවන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ඇ) (iii) වන අනුඡේදයේ පිළිවෙළින් "රුපියල් 10,00,000 ඉක්මවන" සහ "සියයට දහයක අනුප්‍රමාණයට" යන වචන හා ඉලක්කම් වෙනුවට පිළිවෙළින් "රුපියල් 1,500,000 ඉක්මවන" සහ "සියයට අටක අනුප්‍රමාණයකට" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(4) එම වගන්තියේ (ඇ) ඡේදයේ "සියයට දහයක අනුප්‍රමාණයකට" යන වචන වෙනුවට "සියයට අටක අනුප්‍රමාණයකට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තිය සංශෝධනය කිරීම.

**36.** 2007 අංක 10 දරන පනත මගින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "එම අඩුකිරීම, එම පොලිය ගෙවන හෝ බැරකරන නැතහොත් වට්ටම ලබාදෙන අවස්ථාවේදී සිදුකළ යුතුය." යන වචන වෙනුවට "එම අඩුකිරීම, එම සාංගමික ණය සුරැකුම් පත්‍රය නිකුත් කරන අවස්ථාවේදී සිදුකළ යුතුය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තිය ඉවත් කිරීම.

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 153 වන වගන්තිය සංශෝධනය කිරීම.

**38.** 2009 අංක 19 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 153 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ගෙවිය යුතු යම් නිශ්චිත ගාස්තුවකින්" යන වචන වෙනුවට "තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ගෙවිය යුතු සහ ගෙවන ලද යම් නිශ්චිත ගාස්තුවකින්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 155 වන වගන්තිය සංශෝධනය කිරීම.

**39.** 2008 අංක 9 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 155 වන වගන්තියේ "යම් කුලියක්, බදුකුලියක් හෝ වෙනත් ගෙවීමක් කරන සෑම තැනැත්තකු" යන වචන වෙනුවට

"2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව යම් කුලියක්, බදු කුලියක් හෝ වෙනත් ගෙවීමක් කරන සෑම තැනැත්තකු" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**40.** 2008 අංක 9 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 160 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 160 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (ආ) ඡේදයේ "කළමනාකරණ ගාස්තු හෝ වෙනත් සමාන ගාස්තු ගෙවන අවස්ථාවේදී එම වාර්ෂිකය, රාජ්‍ය භාග, කළමනාකරණ ගාස්තු හෝ වෙනත් යම් සමාන ගාස්තු" යන වචන වෙනුවට "යම් කළමනාකරණ ගාස්තු ගෙවන අවස්ථාවේදී, එම වාර්ෂිකය, රාජ්‍ය භාග, කළමනාකරණ ගාස්තු" යන වචන ආදේශ කිරීමෙන්;

(2) (ii) වන අනුඡේදයේ "ගෙවන ලද යම් කළමනාකරණ ගාස්තුවකින් හෝ ගෙවන ලද වෙනත් යම් සමාන ගාස්තුවකින් සියයට පහක" යන වචන වෙනුවට "ගෙවන ලද යම් කළමනාකරණ ගාස්තුවකින් සියයට පහක" යන වචන ආදේශ කිරීමෙන්.

**41.** 2009 අංක 19 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියේ (5) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) (අ) ඡේදයේ "ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට" යන වචන වෙනුවට "ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂයේ නොවැම්බර් මස 30 වන දින සිට"; සහ

(2) (ආ) ඡේදයේ "ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට" යන වචන වෙනුවට "ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂයේ නොවැම්බර් මස 30 වන දින සිට" යන වචන ආදේශ කිරීමෙන්.

**42.** 2007 අංක 10 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 166 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "අභියාචන විභාග කිරීමේ කාර්යය සඳහා" යන වචන වෙනුවට "2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ඉදිරිපත් කරනු ලබන අභියාචන විභාග කිරීමේ කාර්ය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 166 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 167 වන වගන්තිය සංශෝධනය කිරීම.

**43.** ප්‍රධාන ප්‍රඥප්තියේ 167 වන වගන්තියේ (3) වන උපවගන්තියේ “හේතු දක්වා යැවූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත, ඒ තීරණයට විරුද්ධව, අභියාචක විසින්” යන වචන වෙනුවට “හේතු දක්වා යැවූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත, නමුත් 2011 අප්‍රේල් මස 1 වන දින පසුවීමට පෙර ඒ තීරණයට විරුද්ධව අභියාචක විසින්” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එකී වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 168 වන වගන්තිය සංශෝධනය කිරීම.

**44.** ප්‍රධාන ප්‍රඥප්තියේ 168 වන වගන්තියේ “අභියාචනයක් ඔහු විසින් සමාලෝචන මණ්ඩලය වෙත” යන වචන වෙනුවට “ඔහු විසින් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සමාලෝචන මණ්ඩලය වෙත” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එකී වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 170 වන වගන්තිය සංශෝධනය කිරීම.

**45.** ප්‍රධාන ප්‍රඥප්තියේ 170 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (1),(2),(3),(5),(6),(7) සහ (9) යන උපවගන්තිවල “මණ්ඩලය” යන වචනය ඇති සෑම තැන්හිම ඒ වෙනුවට “අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලය හෝ බදු අභියාචන කොමිෂන් සභාව” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (7) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

> “(7අ) අභියාචනාධිකරණය විසින් (1) වන උපවගන්තිය යටතේ අතුරු තීරණයක් කරනු ලබන අවස්ථාවකදී, අභියාචනය අවසාන වශයෙන් නිශ්චය කරනු ලබන තෙක් අධිකරණය විසින් සාධාරණ බවට තීරණය කරනු ලබන ආකාරයට ආරවුලට තුඩුදී ඇති බදු ප්‍රමාණයම හෝ ඉන් යම් කොටසක් ගෙවන ලෙස ආඥාවක් කරනු ලැබිය හැකිය.
>
> අභියාචනාධිකරණය විසින් අවසාන වශයෙන් කරනු ලබන තීරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් පැන නැගෙන යම් අතිරික්ත බදු ප්‍රමාණයක් අභියාචකට ප්‍රතිපූර්ණය කරනු ලැබිය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියට 177අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**46.** ප්‍රධාන ප්‍රඥප්තියේ 177 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එකී වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 177අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය :-

“ප්‍රධාන නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් බදු අය කර ගැනීම.

177(අ) (1) 113 වන වගන්තිය යටතේ නියම කර ඇති යම් බදු මුදලක් නියමිත දිනයේදී හෝ නියමිත දිනයට පෙර යම් සංස්ථාවක් විසින් ගෙවා නොමැති අවස්ථාවකදී, අවස්ථාවෝචිත පරිදි එම සංස්ථාවේ කළමණාකරුවකු, ලේකම්වරයකු, අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන නිලධරයකු විසින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අයුරින් යම් පටහැනි තත්ත්වයක් ඔප්පු කරනු ලැබුවහොත් මිස, එකී සංස්ථාව හා සම්බන්ධ යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද, එය නොතකා, එම සංස්ථාවේ කළමනාකරුට, ලේකම්වරයාට, අධ්‍යක්ෂවරයාට හෝ වෙනත් යම් ප්‍රධාන නිලධරයකුට එම බදු ගෙවීම පැහැර හැරියාසේ සලකා ඔවුන්ට එරෙහිව කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ පනතේ සියලු හෝ යම් විධිවිධාන යටතේ ක්‍රියාකිරීම නීත්‍යානුකූල වන්නේය.

(2) 113 වන වගන්තිය යටතේ නියම කර ඇති බදු මුදලක් නියමිත දිනයකදී හෝ නියමිත දිනයට පෙර යම් සංස්ථාපනය නොකරන ලද පුද්ගල මණ්ඩලයක් විසින් ගෙවා නොමැති අවස්ථාවකදි, අවස්ථාවෝචිත පරිදි, එම පුද්ගල මණ්ඩලයේ හවුල් කරුවකු හෝ ධූර දරන්නකු, කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන අයුරින් යම් පටහැනි තත්වයක් ඔප්පු කරනු ලැබුවහොත් මිස, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද, ඒ හවුල්කරුට හෝ ධූර දරන්නාට එම බදු මුදල් ගෙවීම පැහැර හැරියාසේ සලකා ඔවුන්ට එරෙහිව කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ පනතේ සියලු විධිවිධාන හෝ යම් විධිවිධාන යටතේ ක්‍රියාකිරීම නීත්‍යානුකූල වන්නේය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 200 වන වගන්තිය සංශෝධනය කිරීම.

**47.** 2009 අංක 19 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 200 වන වගන්තිය එහි (8) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

“(9) මෙම වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි යම් තැනැත්තකුට උද්ගතවන ආපසු ගෙවීමක් එම තැනැත්තාගේ බැංකු ගිණුමට කෙලින්ම බැර කරනු ලැබිය යුතුය.”.

204අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**48.** ප්‍රධාන ප්‍රඥප්තියේ 204 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 204අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය :-

"විගණකවරු හා බදු වෘත්තිකයන් විසින් පනතේ විධිවිධාන වැරදි ලෙස අර්ථනිරූපණය කිරීම සම්බන්ධයෙන් දණ්ඩන විධිවිධාන.

204අ. මෙම පනතේ ඕනෑම වගන්තියක් හෝ ඒ යටතේ නිකුත් කොට ඇති යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක් වෘත්තීය රාජකාරි ඉටු කරනු ලබන ඕනෑම විගණකවරයකු හෝ බදු වෘත්තිකයකු විසින් හිතාමතාම වැරදි ලෙස අර්ථනිරූපණය කරන විටක ඔහු මෙම පනත යටතේ වරදකට වරදකරුවකු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ දඩයකට හා බන්ධනාගාරගත කිරීම යන දෙයාකාරයටම යටත් කරනු ලැබිය හැක.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තිය සංශෝධනය කිරීම.

**49.** 2009 අංක 19 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) "පුණ්‍ය කාර්යය" යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි :—

(අ) (ආ) ඡේදයේ "අධ්‍යාපන හෝ දැනුම දියුණු කිරීම;" යන වචන වෙනුවට "සමාගම් පනත යටතේ පිහිටුවන ලද ආයතනයක් හෝ ව්‍යාපාරික කාර්ය සඳහා පිහිටුවන ලද ආයතනයක් නොවන, අධ්‍යාපනය හෝ දැනුම දියුණු කිරීම යන වචන ආදේශ කිරීම;

(ආ) (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

(ආආ) පරිසරය සුරැකීම සඳහා වන කාර්යයන් හෝ පරිසර හිතකාමී කාර්යයන්;";

(2) "බදු අය කළ හැකි ආදායම" යන වචනයේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

"බදු අභියාචනා කොමිෂන් සභාව" යන්නෙන් 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත යටතේ පිහිටුවන ලද, බදු අභියාචනා කොමිෂන් සභාව අදහස් වේ;"

**50.** 2009 අංක 19 දරන පනත මඟින් අවසාන වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු වන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එම උපලේඛනයේ Iඅ කොටසේ "ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන වෙනුවට "ආරම්භවන නමුත් 2011 මාර්තු මස 31 වන දිනට පෙර අවසන්වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ;" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එම උපලේඛනයේ Iඅ කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් කොටස ඇතුළත් කිරීමෙන් :-

**"Iආ කොටස**

2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා II වන කොටසේ හෝ III වන කොටසේ සඳහන් පුද්ගලයන් නොවන වෙනත් පුද්ගලයන් -

| | |
|---|---|
| බදු අයකළ හැකි ආදායමෙහි පළමුවන රු. 500,000 | සියයට 4 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 500,000 | සියයට 8 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 500,000 | සියයට 12 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 500,000 | සියයට 16 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 1,000,000 | සියයට 20 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඉතිරිය | සියයට 24". |

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

**51.** 2009 අංක 19 දරන පනත මඟින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම උපලේඛනයේ අ කොටසේ 1 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"1. යම් අවදානම් ප්‍රාග්ධන සමාගමක් -

(අ) 2006 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව නමුත් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අයවන ආදායම මත **සියයට 20**

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අයකළ හැකි ආදායම මත **සියයට 12**".

(2) එම උපලේඛනයේ ආ කොටස වෙනුවට පහත දක්වා ඇති කොටස ආදේශ කිරීමෙන්;

**"ආ කොටස**

1. (අ) 2006 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂය සඳහා -

බදු අය කළ හැකි ආදායම රුපියල් 5,000,000 නොඉක්මවන සහ අ කොටසෙහි සඳහන් නොවන සමාගමක් වන යම් සමාගමක් **සියයට 15.**

(ආ) 2007 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව නමුත් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

(අ) (i) බදු අය කළ හැකි ආදායම රුපියල් 5,000,000 නොඉක්මවන යම් සමාගමක්,

(ii) "අ" කොටසේ සඳහන් කරන ලද සමාගමක් නොවන සමාගමක්; සහ

(ආ) පාලක සමාගමක්, පාලිත සමාගමක් හෝ සමාගම් සමූහයක ආශ්‍රිත සමාගමක් නොවන

යම් සමාගමක බදු අයකළ හැකි ආදායම මත **සියයට 15.**

(ඇ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

(අ) (i) බදු අය කළ හැකි ආදායම රුපියල් 5,000,000 නොඉක්මවන සමාගමක් ;

(ii) "අ" කොටසේ සඳහන් කරන ලද සමාගමක් නොවන සමාගමක්; සහ

(ආ) පාලක සමාගමක්, පාලිත සමාගමක් හෝ සමාගම් සමූහයක ආශ්‍රිත සමාගමක් නොවන
යම් සමාගමක බදු අය කළ හැකි ආදායම මත **සියයට 12**

මේ අයිතමයේ කාර්ය සඳහා "පාලක සමාගම", "පාලිත සමාගම්" සහ "සමූහ සමාගම්" යන යෙදුම්වලට 2007 අංක 7 දරන සමාගම් පනතේ ඒවාට දී ඇති එම අදාළ අර්ථයක්ම තිබිය යුතුය.

2. යම් සමාගමක්, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍රයක් නිකුත් කරන ලද ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් ප්‍රසිද්ධ කරන ලද යම් නිල ලැයිස්තුවක එහි කොටස් පළමුව ලැයිස්තුගත කළ තක්සේරු වර්ෂය (මෙහි මින් මතු "පළමුවන තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) සහ එම පළමුවන තක්සේරු වර්ෂයකට ඉක්බිතිවම එළඹෙන අවුරුදු හතර ඇතුළත එක් එක් තක්සේරු වර්ෂය සඳහා—

බදු අය කළ හැකි ආදායම රුපියල් 5,000,000 ඉක්මවන එම සමාගම පාලක සමාගමක්, පාලිත සමාගමක් හා සමාගම් සමූහයක ආශ්‍රිත සමාගමක් නම්

එම තක්සේරු වර්ෂය සඳහා එම සමාගමේ බදු අය කළ හැකි ආදායම මත **සියයට 33 1/3**

එසේ වුවද, එම පළමුවන තක්සේරු වර්ෂය 2006 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, සියයට 33 1/3ක අනුප්‍රමාණය අදාළ වනුයේ එම අවුරුදු හතරක කාලය ඇතුළත වන්නාවූ ද, 2006 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන්නා වූ ද, යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙනි.

3. මේ උපලේඛනයේ මීත් පෙර සඳහන් යම් සමාගමක් හැර වෙනත් සමාගමක් සම්බන්ධයෙන් -

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ හැකි ආදායම මත **සියයට 35**

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා **සියයට 28**

4. යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් සමාගමක බදු අය කළ හැකි ආදායම රුපියල් මිලියන පහකට වැඩි වන අවස්ථාවක දී, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගම විසින් මේ පනතට අනුකූලව ආගණනය කරන ලද එසේ වැඩි වූ අතිරික්තයට ආරෝපණය කළ හැකි ඒ බද්දේ කොටස, එම අතිරික්තයට වඩා නොවැඩි විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම.

**52.** 2008 අංක 9 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එකී උපලේඛනයේ 7 වැනි අයිතමයේ—

"2008 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන හෝ 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට

"2008 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එකී උපලේඛනයේ 8 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"8. 101 වන වගන්තියේ සඳහන් කර ඇති යම් සමාජශාලාවක හෝ සමිතියක—

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අයකළ හැකි ආදායම මත සියයට 20.

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අයකළ හැකි ආදායම මත සියයට 10".

**53.** 2008 අංක 9 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එම උපලේඛනයේ 5 වන අයිතමය වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමෙන් :-

"5. යම් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක විදේශ ව්‍යවහාර මුදලින් සිදු කෙරෙන අක්වෙරළ ගනුදෙනුවකින් උද්ගතවන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් ආදායම් බද්දේ අනුප්‍රමාණය-

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා **සියයට 20**

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා දෙවන උපලේඛනය ප්‍රකාරව අදාළ අනුප්‍රමාණය"

(41 වන වගන්තිය)

(2) එම උපලේඛනයේ 6 වන අයිතමයේ "ප්‍රතිලාභියකු උපදින ලාභ සහ ආදායම" යන වචන වෙනුවට "ප්‍රතිලාභියකුට 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව උද්ගතවන ලාභ සහ ආදායම" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) එම උපලේඛනයේ 8 වන අයිතමයේ "කොටස් බලපත්‍ර බැහැර කිරීම සම්බන්ධයෙන් වූ ලාභ හෝ ලැබීම්" යන වචන වෙනුවට "කොටස් බලපත්‍ර 2007 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙරාතුව බැහැර කිරීම සම්බන්ධයෙන් වූ ලාභ හෝ ලැබීම්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) ඒ උපලේඛනයේ 9 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"9. සමාගමක් නොවන තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලබන්නා වූ ද, 45 වන වගන්තියේ හෝ 217 වන වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වන්නාවූ ද,

| | | |
|---|---|---|
| (අ) | කෘෂිකර්මය, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ ඉදිකිරීම් වැඩ සඳහා වූ ව්‍යවසායකින් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණය - | පළමුවන උපලේඛනය ප්‍රකාරව, සියයට 15ක උපරිමයකට යටත්ව |
| (ආ) | කෘෂිකර්මය, සත්ව ආහාර නිෂ්පාදනය, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ ඉදිකිරීම් වැඩ සඳහා වූ ව්‍යවසායකින් 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලාභ සහ ආදායම් බදු අනුප්‍රමාණය | පළමුවන උපලේඛනය ප්‍රකාරව, සියයට 12ක උපරිමයකට යටත්ව"; |

(45 වන වගන්තිය)

(5) ඒ උපලේඛනයේ 10 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"10. සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන්නා වූ ද 46 වන වගන්තියේ හෝ 217 වන වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වන්නාවූද,

(අ) කෘෂිකර්මය, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ ඉදිකිරීම් වැඩ සඳහා වූ ව්‍යවසායකින් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණය - **සියයට 15**

(ආ) කෘෂිකර්මය, සත්ව ආහාර නිෂ්පාදනය, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ ඉදිකිරීම් වැඩ සඳහා වූ ව්‍යවසායකින් 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණය - **සියයට 12** ";

(46 වන වගන්තිය)

(6) එම උපලේඛනයේ 11 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"11. විශේෂිත නිවාස බැංකුවලට අදාළව-

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා අනුප්‍රමාණය- **සියයට 20**

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා අනුප්‍රමාණය- දෙවැනි උපලේඛනය යටතේ උචිත අනුප්‍රමාණයම.";

(47 වන වගන්තිය)

(7) එම උපලේඛනයේ 14 වන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතමය ඇතුළත් කිරීමෙන් :-

| | |
|---|---|
| "14අ 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා 16 වන වගන්තියේ සඳහන් යම් ව්‍යවසායක ලාභ සහ ආදායම සම්බන්ධයෙන් - | පළමුවන උපලේඛනය ප්‍රකාරව පුද්ගලයකු සම්බන්ධයෙන් සියයට 10 ක උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 10"; |

(48අ වන වගන්තිය)

(8) එම උපලේඛනයේ 16 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"16. 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙර නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන සමාගමක් නොවන තැනැත්තකුගේ -

| | |
|---|---|
| (අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය- | පළමුවන උපලේඛනය ප්‍රකාරව සියයට 15 ක උපරිමයකට යටත්ව |
| (ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය- | පළමුවන උපලේඛනය ප්‍රකාරව සියයට 12 ක උපරිමයකට යටත්ව "; |

(50 වන වගන්තිය)

(9) එම උපලේඛනයේ 17 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"17. 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙර නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන සමාගමක -

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය- **සියයට 15**

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් **සියයට 12"**;

(51 වන වගන්තිය)

(10) එම උපලේඛනයේ 18 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"18. 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙර නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන සමාගමක -

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය- **සියයට 15** ";

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය- **සියයට 12** ";

(52 වන වගන්තිය)

(11) එම උපලේඛනයේ 20 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"20. යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක -

| | |
|---|---|
| (අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා සැලකුණු අපනයනවලින් ලැබූ ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය- | පළමුවන උපලේඛනය ප්‍රකාරව, පුද්ගලයකු සම්බන්ධයෙන් සියයට 15 උපරිමයට යටත්ව සහ සමාගමක් සඳහා සියයට 15 |
| (ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සැලකුණු අපනයනවලින් ලැබූ ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය. - | පළමුවන උපලේඛනය ප්‍රකාරව, පුද්ගලයකු සම්බන්ධයෙන් සියයට 12 උපරිමයට යටත්ව සහ සමාගමක් සඳහා සියයට 12”; |

(56 වන වගන්තිය)

(12) එම උපලේඛනයේ 24 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"24. කිසියම් හවුල් ව්‍යාපාරයක, යම් තක්සේරු කිරීමක් මත හැර, -

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බෙදිය හැකි ලාභ සහ වෙනත් ආදායම් මත බදු අනුප්‍රමාණය- **සියයට 10**

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බෙදිය හැකි ලාභ සහ වෙනත් ආදායම් මත බදු අනුප්‍රමාණය **සියයට** 8 ”;

(78 වන වගන්තිය)

(13) එම උපලේඛනයේ 25 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"25. විනෝදාස්වාදය සපයන්නකුගේ හෝ ශිල්පියකුගේ වෘත්තිය හෝ රැකියාව කරගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකුට අදාළව ආදායම් බදු අනුප්‍රමාණය -

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා - **සියයට 15**

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා - **සියයට 12** ";

(96 වන වගන්තිය)

(14) එම උපලේඛනයේ 26 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"26. 105 වන වගන්තියේ සඳහන් පරිදි ඛනිජ තෙල් කැණීමෙන් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු ලබාගත් කිසියම් ලාභාංශයකට සහ ආදායමකට අදාළව -

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය-

**සියයට 15**

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා ලැබූ ලාභ සහ ආදායම සම්බන්ධයෙන් අනුප්‍රමාණය-

**සියයට 12**";

(105 වන වගන්තිය)

(15) එම උපලේඛනයේ 27 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"27. රාජ්‍ය නොවන සංවිධානයක් විසින් පිහිටුවන ලද අරමුදලකට ලැබුණු හෝ අරමුදල් ලැබීම මත වූ ලාභවලට අදාළව -

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය- **සියයට 30**

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය- **සියයට 28** ”

(102 වන වගන්තිය)

(16) එම උපලේඛනයේ 28 වැනි අයිතමයට ඉක්බිතිවම, පහත දැක්වෙන අයිතමයන් එකතු කිරීමෙන් :-

“29. යම් පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක් 2011 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මද්‍යසාර හෝ දුම් කොළ නිෂ්පාදිතයන්, නිෂ්පාදනයෙන් හා විකිණීමෙන් හෝ ආනයනය හා විකිණීමෙන් ලැබෙන ලාභ හෝ ආදායම සංයුක්ත වන එම පුද්ගලයාගේ හෝ හවුල් ව්‍යාපාරයේ බදු අය කළ හැකි ආදායමේ, අදාළ ආදායම් බදු අනුප්‍රමාණය- **සියයට 40**

| | |
|---|---|
| 30. 59අ වගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් යම් පුද්ගලයකු ලබන්නා වූ ලාභ කොටස මත අදාළ කළ හැකි ආදායම් බදු අනුප්‍රමාණය- | පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් පුද්ගලයකු සම්බන්ධයෙන් සියයට 10 උපරිමයකට සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 10 |
| 31. ගබඩා කිරීමේ, මෘදුකාංග සංවර්ධනය කිරීමේ හෝ කම්කරුවන් සැපයීමේ පහසුකම් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යෑම සඳහා ශ්‍රී ලංකාවේදී පවත්වාගෙන යනු ලබන යම් ආයතනයක ලාභ සහ ආදායමට අදාළව ආදායම් බදු අනුප්‍රමාණය- | පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් පුද්ගලයකු සම්බන්ධයෙන් සියයට 10 උපරිමයකට සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 10 |

| | | |
|---|---|---|
| 32. | අධ්‍යාපනික සේවාවන් මගින් උද්ගතවන ලාභ සහ ආදායම් මත ආදායම් බදු අනුප්‍රමාණය | පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් පුද්ගලයකු සම්බන්ධයෙන් සියයට 10 උපරිමයකට සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 10 |
| 33. | මිලට ගෙන විකිණීමේ කටයුත්තක් නොවන වාර්ෂික පිරිවැය මිලියන තුන්සීය නොඉක්මවන යම් ව්‍යවසායකට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය | **සියයට 10**"; |

**54.** ප්‍රධාන ප්‍රඥප්තියේ 208 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 208අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු යː-

208අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"පනත්වල විධිවිධාන අර්ථ නිරූපණය කිරීම සඳහා කමිටුවට අවසර දීම.

208අ. කොමසාරිස් ජනරාල්වරයා විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයන්ගෙන් සමන්විත කමිටුවක්, ඔහු විසින් පරිපාලනය කරනු ලබන සියලු පනත්වල විධිවිධාන, එකී පනත්වල පටහැනිව කුමක් සඳහන් වුව ද, අර්ථ නිරූපණය කිරීම සඳහා අවසරය සහිතව පත් කරනු ලැබිය යුතු ය. එකී අර්ථ නිරූපණය සම්බන්ධයෙන් ඒකාකාරී බවක් පවත්වාගෙනයාම සහතික කරනු වස් එම කමිටුව විසින් එම අවසරයට අදාළව අවශ්‍ය සියලු මාර්ගෝපදේශ සහ උපදෙස් නිකුත් කළ යුතු ය.".

**55.** 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ ආදායම් බදු ගෙවීමට යටත් වන, රුපියල් මිලියන සියයක් නොඉක්මවන වාර්ෂික පිරිවැටුමක් පවත්නා යම් ව්‍යවසායක් කරගෙන යනු ලබන යම් පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්, 2010 මාර්තු මස 31 වන දිනට පෙරාතුව අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා එකී පනත යටතේ ආදායම් බදු ගෙවීම, අර්බුදකාරී වාතාවරණයක් පැවතීම හෝ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් පැහැර හැර ඇත්නම්, එම පුද්ගලයා හෝ හවුල් ව්‍යාපාරය බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය :

සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් විසින් ගෙවිය යුතු ආදායම් බද්ද නිදහස් කිරීම.

එසේ වුවද, තත්කාර්ය සඳහා කරන ලද ඉල්ලීමකට අනුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ගෙවීම පැහැර හැර ඇති බදු සම්බන්ධයෙන් නිදහස් කිරීමේ සහතිකයක් එකී තැනැත්තා වෙත හෝ හවුල් ව්‍යාපාරය වෙත නිකුත් කරනු ලැබිය යුතු ය :

එසේම තවදුරටත්, නිදහස් කිරීමේ සහතිකය නිකුත් කර ඇත්තේ යම් පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක් වෙතද, එම පුද්ගලයා හෝ හවුල් ව්‍යාපාරය විසින්, 2010 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් එකී පනත යටතේ තමා විසින් ගෙවිය යුතු වන සියලු මුදල් ගෙවීම සඳහා එම පුද්ගලයා හෝ හවුල් ව්‍යාපාරය වගකියනු ලබන බවට වූ ලිඛිත සහතිකයක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඒ සමගම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

අතීතයට බලපෑම.

**56.** මේ පනතේ විධිවිධාන මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2011 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතුය:

එසේ වුව ද—

(අ) මේ පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය මගින් 7 වන වගන්තියට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2008 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මකභාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය ;

(ආ) මේ පනතේ පිළිවෙළින් 10 වන 11 වන සහ 12 වන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20,21 සහ 21අ වගන්තිවලට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2009 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මකභාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතුය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**57.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.